## ජා-ඇල නගර සභාව

## ගම්පහ දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 29 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 04 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 නොවැම්බර් 30 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

#### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව ජා-ඇල නගර සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, සභාපතිවරයාට යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට ජා-ඇල නගර සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිපල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

#### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

##### 1.3.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

**(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්**

2011 දෙසැම්බර් 31 දින වන විට විගණන විමසුම් 16 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එකී විමසුම්වලට භාජනය වූ ගනුදෙනු වල ගණනය කළ හැකි වටිනාකම රු. 4,203,069 ක් විය.

**(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 35,594,866 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 183,700 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,614,044 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන ඌනතා/අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) මහජන බැංකුවේ ජංගම ගිණුමට අදාලව බැංකු සැසඳුමේ රු.257,500 ක බැර ශේෂයක් වර්ෂයකට අධික කාලයක සිට ඉදිරියට ගෙන එමින් තිබුණද, හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අතැති මුදල් ශේෂය වූ රු.25,663 ක් වර්ෂය පුරාම බැංකු ගත නොකර අත රදවාගෙන තිබුණි.

(ඇ) මහජන බැංකු ජංගම ගිණුමේ ශේෂය රු.5,866,596 ක් වුවත්, ගිණුම්වල රු.5,892,258 ක් ලෙස දක්වා තිබුණි.

(ඈ) ලංකා බැංකු ජංගම ගිණුමේ රු.58,029 ක ශේෂය 2011 අප්‍රේල් මාසයේ සිට නිශ්කාර්යව තිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| (i.) වරිපනම් හා බදු | 13,955 | 13,565 | 17,346 |

| | | | | |
|---|---|---|---|---|
| (ii.) | බදු කුලී | 7,204 | 6,982 | (755) |
| (iii.) | බලපත්‍ර ගාස්තු | 348 | 286 | 121 |
| (iv.) | වෙනත් ආදායම් | 23,561 | 18,755 | 2,900 |

**2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු මුදල රු. 471,755 ක් විය.

**2.4 අචල ජංගම වත්කම්**

අවුරුදු 02 ක කාලයක සිට ඉදිරියට ගෙන එමින් තිබෙන සේවකයින් 26 දෙනෙකුගෙන් අයවිය යුතු හිඟ ණය ශේෂය රු.210,537 ක් විය. 1986 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් තිබෙන හිඟ විදුලිය ගාස්තු රු1,110,620 ක්, තානායම් ගාස්තු රු.216,659 ක් හා විනෝද බදු රු.4,916,354 ක් අයකිරීමට කටයුතු කර නොතිබුණි.

**2.5 මානව සම්පත් කළමනාකරණය**

(i) සමාලෝචිත වර්ෂය තුළදී සේවකයින් 11 දෙනෙකු බඳවා ගෙන තිබූ අතර, ඒ සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ii) බඳවා ගෙන තිබූ තාක්ෂණ නිලධාරි (විශ්‍රාමික) එක් අවුරුදු කාලයකට හෝ ඒ සඳහා නිලධාරියෙකු පත්කරන තුරු සේවය කිරීමට අනුමැතිය ලබාදී තිබුණි. 2011 සැප්තැම්බර් මාසයේ තනතුර සඳහා නිලධාරියෙක් පත්කිරීම කර තිබුණද, විශ්‍රාමික නිලධාරියාද සේවයේ යොදවා තිබුණි.

(iii) අනුමත තනතුරු සංඛ්‍යාව ඉක්මවා විවිධ තනතුරු වලට සේවකයින් 19 දෙනෙකු බඳවා ගෙන වැටුප් ගෙවා තිබුණි.

**2.6 මෙහෙයුම්/ කළමනාකරණ අකාර්යක්ෂමතා**

**2.6.1 වාහන අලුත්වැඩියා කිරීම**

අංක 49-3723 දරණ ට්‍රැක්ටරය, 37-6692 දරණ ට්‍රැක්ටරය හා ආර්ජ් 2087 දරණ ට්‍රැක්ටරය අලුත්වැඩියාව වෙනුවෙන් පිළිවෙලින් 103,700 ක මුදලක් ගෙවීම් කර තිබුණි. පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වාහන අලුත්වැඩියා සඳහා ඇස්තමේන්තුවක් නොමැති අතර, අදාළ අලුත්වැඩියාව සඳහා යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ නිර්දේශ ලබාගෙන නොතිබුණි.

(ආ) වාහන අලුත්වැඩියාව සඳහා මිලගණන් කැඳවීමක් කර නොමැති අතර, ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ඇ) අමතර කොටස් යෙදීම වෙනුවෙන් රු.91,425 ක මුදලක් ගෙවා තිබුණද, ඉවත් කල අමතර කොටස් ගබඩාවට භාරදී නොතිබුණි.

(ඈ) යෙදූ අමතර කොටස් පිළිබඳ සඳහනක් නොමැතිව යාන්ත්‍රික ඉංජිනේරු විසින් අළුත්වැඩියාව සඳහා ගෙවීමට අනුමැතිය ලබාදී තිබුණි.

**2.6.2 හිඟ ජල බිල්පත් ගෙවීම**

------------------------

සාප්පු සංකීර්ණය සඳහා වෙනම ජල මනුවක් සවි නොකර, හිඟ ජල ගාස්තු මුදලක් වෙනුවන් රු.104,244 ක් නගර සභා අරමුදලින් ගෙවා තිබුණි.

**2.6.3 අරමුදල් ඌන උපයෝජනය**

------------------------------

(i) බස්නාහිර පලාත් පාළන කොමසාරිස්ගේ 1995 මාර්තු 09 දින අංක LGD/95/4/බ.ප.පා කොමසාරිස්ගේ ලිපිය අනුව ස්ථාවර තැන්පත් මුදල් ආපසු ලබා ගැනීමේදී කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගත යුතු වුවද මාතෘ සායනය හා ආදාහනාගාරය ඉදිකිරීමට 2010 සැප්තැම්බර් 23 දින හා 2011 ජූලි 07 දින පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය රහිතව පිළිවෙලින් රු.4,160,170 ක් හා රු.4,553,053 ක ස්ථාවර තැන්පත් 02 ක මුදල් ලබාගෙන තිබුණි. ආදාහනාගාරය සඳහා යෝජිත ඉඩම සභාව සතු බවට තහවුරු කිරීමට අවශ්‍ය ඔප්පුව හෝ පැවරුම් නියෝග ලබාගෙන නොතිබුණි.

(ii) 2011 ජූනි 28 දින නැවත 2010 වර්ෂයේ මාර්ග ඉදිකිරීම් සඳහා වෙන්කල ප්‍රතිපාදන ඉක්මවා වැඩ අවසන් කල කර්මාන්ත හා අත රැඳවුම් කර්මාන්ත මුදල් ගෙවීම සඳහා ස්ථාවර තැන්පත් ඇපයට තබා ණය මුදලක් ලබා ගැනීම සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස්ගෙන් අනුමැතිය ඉල්ලා තිබුණි. අදාල කර්මාන්ත වියදම් 2011 ප්‍රතිපාදන වලින් ගෙවීමට පළාත් පාලන කොමසාරිස් උපදෙස් දී

තිබුණද, එකී නියමයන්ට පටහැනිව 2011 ජූලි 22 දින රු.8,000,000 ක ණය මුදලක් ස්ථාවර තැන්පත් ඇපයට තබා ලබාගෙන තිබුණි.

(iii) ස්ථාවර තැන්පත් ඇපයට තබා ලබාගත් රු.9,513,223 ක ණය මුදලින් සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.3,373,722 ක් වියදම් දරා තිබුණෙන් ඒ අනුව ණය මුදලින් 35% ක ප්‍රතිශතයක් පමණක් උපයෝජනය කර තිබුණි.

2.7 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඝණ අප ද්‍රව්‍ය එකතු කිරීම හා බැහැර කිරීම නගර සභාව විසින් සිදු කරනු ලබන අතර, ඝණ අපද්‍රව්‍ය වෙන්වෙන්ව හෝ ප්‍රමිතීන්ට අනුව වර්ග කිරීමකින් තොරව නගර සභාව සතු සුදුවැල්ල වගුරුබිම් ආශ්‍රිතව ඉඩමකට බැහැර කර තිබුණි.

(ආ) ඝණ අපද්‍රව්‍ය බැහැර කිරීමට යොදවා ගන්නා ලද සේවකයින්ට නිසි සෞඛ්‍ය ආරක්ෂිත උපකරණ වෙනුවට ග්ලවුස් පමණක් සපයා තිබුණි.

(ඇ) ඝණ අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමයක් ලෙස කොම්පෝස්ට් පොහොර නිපදවීම, ප්‍රතිචක්‍රීයකරණය හෝ වෙනත් ක්‍රමයක් අනුගමනය කර නොතිබුණි.

2.8 දූෂ්‍ය අක්‍රමික ගනුදෙනු

--------------------------

සමාලෝචිත වර්ෂයේදී සේවකයන් හය දෙනෙකු නමින් ව්‍යාජ ලෙස රු.1,060,700 ක ආපදා ණය මුදල් ගෙවා තිබුණි. ගෙවීම් ලේඛනවල දක්වා තිබූ සේවකයන් විසින් ණය මුදල් ඉල්ලුම් කර නොතිබුණු අතර ඉදිරිපත් කර තිබූ ණය ඉල්ලුම්පත් හා ලියකියවිලි ව්‍යාජ ඒවා විය. මෙම ණය ඉල්ලුම්පත් ඉදිරිපත් කර තිබූ නිලධාරිනියන් තිදෙනෙකු මෙම ණය මුදල් සියල්ල ව්‍යාජ ලෙස ලබා ගෙන තිබුණි.

2.9 ක්‍රියාකාරී සැලැස්ම

----------------------

(අ) ක්‍රියාකාරී සැලසුමට ඇතුලත්ව තිබූ ඇස්තමේන්තු පිරිවැය රු.80,631,500 ක් වූ ව්‍යාපෘති 04 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) සංවර්ධන යෝජනා ක්‍රම 12 ක් ක්‍රියාත්මක කිරීමට යෝජනා කර තිබුණද, ඒ සඳහා මුල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කර නොතිබුණි.

3 පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර විගණනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) කොන්ත්‍රාත් පාලනය